## ඉංග්‍රීසි භාෂාව පිළිබඳ පශ්චාත් උපාධි ආයතනය - 2014

ඉංග්‍රීසි භාෂාව පිළිබඳ පශ්චාත් උපාධි ආයතනයේ 2014 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 107(5) උපවගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. විශ්වවිද්‍යාල පනතේ 108(1) උපවගන්තිය ප්‍රකාර ආයතනයේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

### 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

### 1.3 විගණකගේ වගකීම

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරීවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස ආයතනයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ආයතනයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගැයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගැයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය හා ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වන වගන්තියේ (3) හා (4) උපවගන්ති වලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්තවාගණනය කරනු ලැබේ.

**02. මූල්‍ය ප්‍රකාශන**

**2.1 තත්ත්වාගණනය කළ මතය**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2014 දෙසැම්බර් 31 දිනට ඉංග්‍රීසි භාෂාව පිළිබඳ පශ්චාත් උපාධි ආයතනයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම.**

**2.2.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 07**

සම්පූර්ණයෙන් ක්ෂය කරන ලද පිරිවැය රු.2,049,239 ක වත්කම් තවදුරටත් භාවිතා කරමින් පැවතියද, සාධාරණ අගයක් පෙන්නුම් කිරීම සඳහා ප්‍රත්‍යාගණනය කිරීමට කටයුතු කර නොතිබුණි.

**2.3 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම.**

නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවූ අවස්ථා පහත සඳහන්වේ.

| නීති රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම |
| --- | --- |
| (අ) 2011 ජුලි 12 දිනැති අංක 959 දරන විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛයේ IV පරිච්ඡේදය | පරිවාස කාලයේ සිටින ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරයකුට වසර 3 ක විදේශ නිවාඩු ලබා දී තිබුණි. |
| (ආ) 2011 ජනවාරි 27 දිනැති අංක PED 56 දරන රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තු චක්‍රලේඛය | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට භාණ්ඩාගාර අනුමැතියකින් තොරව රු.11,890,966 ක් ආයෝජනය කර තිබුණි. |
| (ඇ) විශ්වවිද්‍යාල හා උසස් අධ්‍යාපන ආයතන සඳහා වූ ආයතන සංග්‍රහය XX පරිච්ඡේදයේ 3.1 වගන්තිය | විශ්වවිද්‍යාලයේ අධ්‍යයන කාර්ය මණ්ඩලයේ පැමිණීම සහ පිටවීම් තහවුරු කර ගැනීමකින් තොරව සමාලෝචිත වර්ෂයේ වැටුප් හා දීමනා ලෙස රු.6,162,479 ක් ගෙවා තිබුණි. |

**03.** මූල්‍ය සමාලෝචනය

**3.1** මූල්‍ය ප්‍රතිඵලය

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් කටයුතු වල මූල්‍ය ප්‍රතිඵලය රු.2,400,723 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.3,413,496 ක් වූයෙන් මූල්‍ය ප්‍රතිඵලය රු.1,012,773 කින් පිරිහී තිබුණි. ඉකුත් වර්ෂයට සාපේක්ෂව පුද්ගල පඩිනඩි රු.2,131,924 කින් වැඩිවීම මේ සඳහා ප්‍රධාන වශයෙන් හේතුවී තිබුණි.

**04.** මෙහෙයුම් සමාලෝචනය

**4.1** කාර්යසාධනය

පසුගිය වසරට සාපේක්ෂව උපාධි සුදුසුකම සම්පූර්ණ කළ සිසුන් ගණන 05 සිට 04 දක්වා අඩු වී තිබූ අතර සමස්ථ ආදායම සියයට 10.58 කින් වර්ධනය වන විට සමස්ථ වියදම සියයට 22.97 කින් වැඩි වී තිබුණි.

**4.2** අරමුදල් ඌන උපයෝජනය

ආයතනයේ ප්‍රග්ධන වියදම් සඳහා භාණ්ඩාගාරයෙන් ලැබුණු මුදල් උපයෝජනය නොකර ඉතිරි වූ ප්‍රදාන සැලකිල්ලට නොගෙන නැවත නැවතත් ඉල්ලීම් කර ප්‍රාග්ධන වියදම් සඳහා මුදල් ලබාගෙන තිබූ බැවින් 2013 වර්ෂයේ හා සමාලෝචිත වර්ෂය අවසානයේ පිළිවෙලින් රු.3,225,092 ක හා රු.8,216,882 ක ප්‍රාග්ධන ප්‍රදාන උපයෝජනය නොකර ඉතිරිව තිබුණි.

**4.3** හඳුනාගන්නා ලද පාඩු

මුදල් රෙගුලාසි 676 (2) අනුව දැන්වීම් පළකිරීමේදී භාෂාත්‍රයෙන් සහ එක් භාෂාවකින් එක දැන්වීමක් පමණක් පළකලයුතු වුවත් එකම දැන්වීම එකම භාෂාවකින් පුවත්පත් දෙකක පළකිරීම සඳහා රු. 194,656 ක් දරා තිබුණි. එසේම රජයට අයත් පුවත්පත් සමාගමක් තිබියදී පුද්ගලික සමාගම් වලද දැන්වීම් පළ කර තිබුණි.

**4.4** කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු

නව ගොඩනැගිල්ල ඉදිකිරීමේ කොන්ත්‍රාත්තුව රු.මිලියන 76 කට ඇස්තමේන්තු කර පුද්ගලික සමාගමක් සමඟ ගිවිසුමකට එළඹ තිබූ අතර ඇති කරගත් එම ගිවිසුමේ, කොන්ත්‍රාත් වටිනාකම, සම්පූර්ණ කළයුතු කාලසීමාව, ප්‍රමාද ගාස්තු සහ රඳවාගැනීම් නිදහස් කළයුතු ආකාරය වැනි කොන්ත්‍රාත්තුවට අදාළ වැදගත් කොන්දේසි ඇතුළත් කර නොතිබුණි.

**05.** ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

**5.1** අයවැය ලේඛනමය පාලනය

අයවැය ගත ආදායම් හා වියදම් තත්‍ය ආදායම් හා වියදම් සමඟ සැසඳීමේදී ප්‍රමාණාත්මක විචලතාවයන් දක්නට ලැබිණි. ඒ අනුව අයවැය ලේඛනය ඵලදායී මූල්‍ය පාලන කාරකයක් ලෙස උපයෝගී කරගෙන නොමැති බව නිරීක්ෂණය විය.

## 06. පද්ධති හා පාලනයන්

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු ආයතනයේ අධ්‍යක්ෂවරයා වෙත වරින් වර දැනුම් දෙන ලදී. පහත සඳහන් ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමුකල යුතුය.

(අ) කාර්ය මණ්ඩල පරිපාලනය
(ආ) අයවැය පාලනය
(ඇ) විදේශ ශිෂ්‍යත්ව
(ඈ) මුදල් හා බැංකු